1544

M 0 1



# ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව
## ගල්ඔය දකුණු ඉවුර- දමන ව්‍යාපාරය

17 MAY 2018
ව්‍යාපාර කළමනාකරණ අංශය

රැස්වීම පැවැත් වූ ස්ථානය- නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය දමන
රැස්වීම පැවැත් වූ දිනය හා වේලාව- 2018. 01. 30
රැස්වීමේ ප්‍රධානත්වය- නේවාසික ව්‍යාපෘති කළමණාකරු

සහභාගිත්වය

රජයේ නිලධාරි මහතුන්

| අනු අංකය | නම | තනතුර | ස්ථානය |
|---|---|---|---|
| 01 | එස් .එල්. ඒ. අන්සාර් මහතා | නේවාසික ව්‍යාපෘති කළමණාකරු | දමන |
| 02 | එස්. එම්. අයි. නාරායන මහතා | වගා කළමනාකරු | හිඟුරාණ |
| 03 | යූ. පී. කේ. ඩී. උයන්වත්ත මිය | ජනපද නිලධාරි | එරගම |
| 04 | අයි. එම්. ටී. එම්. බණ්ඩාර මහතා | වාරිමාර්ග ඉංජි සහකාර | දමන |
| 05 | පී ඩී අයි රම්‍යලතා | සංවර්ධන සහකාර | දමන |
| 06 | ඒ බසීර් මහතා | සංවර්ධන නිලධාරි | දමන |
| 07 | ඒ කාබුදීන් මහතා | සංවර්ධන නිලධාරි | දමන |

ගොවි නියෝජිත මහතුන්

| අනු අංකය | නම | තනතුර | ස්ථානය |
|---|---|---|---|
| 01 | යූ එල් සුලෙයිමා ලෙබ්බේ මයා | සභාපති | පෙරුවලි කණ්ඩම් ගොවි සංවිධානය |
| 02 | ආර් කේ බී එම් සමන්ත රාජපක්ෂ මයා | සභාපති | තිස්ස ගොවි සංවිධානය |
| 03 | ඒ එල් කේ ලෙබ්බේ මයා | ලේකම් | වික්ලමඩුව ගොවි සංවිධානය |
| 04 | ඩබ් ආර් ජයතිලක මයා | ලේකම් | පැරකුම් ගොවි සංවිධානය |
| 05 | පී එච් පුලිනදාස මයා | සභාපති | දිවියාගල ගොවි සංවිධානය |
| 06 | කරුණාරත්න ගනේගෙදර මයා | ල්කම් | තිස්ස ගොවි සංවිධානය |
| 07 | ආර් එම් පියතිලක මයා | සභාපති | ලක්මිණි ගොවි සංවිධානය |
| 08 | ඩී එම් විරසිංහ මයා | ලේකම් | නාරංගහපල්ලම ගොවි සංවිධානය |
| 09 | එල් පී ජයතිස්ස මයා | සභාපති | සේනානායක ගොවි සංවිධානය |
| 10 | ඒ එස් සමින්ද මයා | සභාපති | හෙළගම්පුර ගොවි සංවිධානය |
| 11 | එච් ඒ ගාමිණී ගුණසිංහ මයා | සභාපති | වරිපතන්චේන ගොවි සංවිධානය |
| 12 | කේ පී එස් කොඩිතුවක්කු මයා | ලේකම් | කරලැව ගොවි සංවිධානය |
| 13 | එම් පී මුණිදාස මයා | සභාපති | මීගහපල්ලම ගොවි සංවිධානය |

පිළිගැණිම හා අරමුණ පැහැදිලි කිරිම - එස් එල් ඒ අන්සාර් නේවාසික ව්‍යාපෘති කළමණාකරු දමන

2018 වර්ෂය සුභ නව වසරක් වේවායි පළමුව ප්‍රාර්ථනා කරමින් 2018 වර්ෂයේ පළමු ව්‍යාපාර කමිටු රැස්වීම සාර්ථක කර ගැනිමට සහය දැක්වීම සඳහා මාගේ ආරාධනය පිලිගෙන මෙහි පැමිනි සියලුම ආයතන වල නිළධාරි මහත්ම/මහත්මීනුත් ගොවි සංවිධාන වල සියලුම නිළධාරින් ඇතුලු සාමාජික මහත්වරුනුත් මා ඉතා ගෞරවයෙන් යුතුව පිලිගනු ලබනවා.

මේ වන විට වගාවේ තත්වය හා ඒ සම්බන්ධව ඇති ජල ප්‍රශ්න පිලිබදව අද දින වැඩිපුර අවධානය යොමු කිරිම වැදගත් හේතුව සිනි සමාගම සතුව පැවති උක් ඉඩම් බොහෝමයක මේ කන්නයේ දි වී වගා කිරිමට අනුමැතිය ලැබීම නිසා එම ප්‍රදේශයට විශාල ජල ප්‍රමාණයක අවශ්‍යතාවයක් පවතිනවා නමුත් වැවේ ජල මට්ටම ඉතාම අඩු මට්ටමකයි පවතින්නේ . ඒ අනුව එළදායි අදහස් එක්කරමින් රැස්වීම සාර්ථක කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

| ඉදිරිපත් කල අය | ගැටලුව | විසදුම | වගකීම | කාලය |
|---|---|---|---|---|
| වාරිමාර්ග කටයුතු | | | | |
| අයි එම් ටී එම් බණ්ඩාර මහතා | මේ වන විට සේනානායක සමුද්‍රයේ ජල ධාරිතාවය අක්කර අඩි 103000 ක් වන අතර එය උසින් 53 .06 කි. අක්කරපත්තු ප්‍රදේශයට ලබා දුන්නේ අවසන් ජල මුරය වන අතර දමනට තව ජල මුරයක් පමණක් ලබා දිමට හැකියි. ජලය අරපිරිමැස්මෙන් පරිහරනය කිරිමට සහය දැක්වූ සියලු දෙනාට ස්තුතිය පිරිනැමිමට කැමතියි. | | | |

| | | | |
|---|---|---|---|
| ජ් එල් කේ ලෙබ්බේ මහතා | සිනි සමාගමේ අවිධිමත් ජල පාලනය නිසා වී වගාවට හානි සිදු වීම<br>පල්ලංඹය හරහා ගලා යන ජලය ඇනිකට් එකකින් හරස් කර පරක්කාඩ් ඇනිකට් එක හරහා ගොවීන්ගේ ප්‍රයෝජනයට ලබා දෙන ලෙස කල ඉල්ලීම<br>ස්ටොක් එකක් ලෙස පාදාගොඩ වැව ගොඩ දමා ප්‍රයෝජනයට ගන්නා ලෙස කල ඉල්ලීම | කුණු ඇල කොතෙක් දුරට ඇත්දැයි පරික්ෂා කර බලා එය ගොඩ දමා ජලය ලබා දිය හැකිදැයි පරික්ෂා කර බැලීමට පැමිනෙන බව පැවසිය පාදාගොඩ වැව ගොඩ දැමීම සම්බන්ධව යෝජනාව ලිඛිතව ඉදිරිපත් කරන ලෙස ද දැන්විය | වා මා දෙ |
| පුලිනදාස මහතා දිවියාගල ගොවි සංවිධානය | දිවියාගල කොටසෙන් ගලා යන කුණු ඇල ගොඩවීම නිසා කුඹුරු යට වී හානි සිදු වන බැවින් එම කුණු ඇල ගොඩ දමා ජලය ලබා ගැනීමට අවස්ථාව සලසා දිම සම්බන්ධව අපගේ කිසිදු විද්ධතාවයක් නොමැත. | | |
| කේ ගනේගෙදර මයා තිස්ස ගොවි සංවිධානයේ ගරු ලේකම් | පාදාගොඩ වැවේ රොන් මඩ ඉවත් කරන්නේ නම්එහි රැදෙන ස්ටොක් ජලය මගින් ආර් බී 5 ඇලේ ජල ප්‍රශ්නයටත් විසදුමක් ලැබේවි එග්ගල්ඔයේ පිටවාන සකස් වී ඇත්තේ ද පාදාගොඩ වැව කේන්ද්‍රකරගෙනයි කෙසේ වෙතත් නිශ්චිත ජල පාලන ක්‍රමයක අවශ්‍යතාවය නම් පැහැදිලියි. | | |
| ඩබ් ආර් ජයතිලක මයා පැරකුම් ගොවි සංවිධානයේ ගරු ලේකම් | පහළලන්ද පන්සල අසල ඇති වැවද කලින් විශාල වැවක් ඒ වැවි සියල්ලම මේ වනවිට ගොඩ වී ඇත මේවා ගොඩ දැමීමෙන් පරිසර සමතුලිතතාවය ආරක්ෂා කල හැකියි යම් ජල ප්‍රමාණයක් රැදී තිබීම මිනිසුන්ට මෙන්ම සතුන්ටත් ප්‍රයෝජනවත්<br>පල්ලංඔයේ ජලය ආර් බී 5 ඒ ඇලටත් ලබා ගත හැකියි සයිබන්ට් එක අසලින් නල මාර්ගයකින් ගත හැකියි. මේ පිලබදව ද සොයා බලන්න | මේ පිලිබදව වාරිමාරග ඉංජිනේරුතුමන් සමග සාකච්ජා කිරිමට එකග විය පල්ලංඔයේ ජලය 5 ඒ ඇලට ලබා ගැනිමේ මාර්ගයන් ඇත්දැයි සොයා බැලිමට එකග විය | වා මා දෙ |
| පුලිනදාස මහතා දිවියාගල ගොවි සංවිධානය | ගිණි පෙට්ටි පාලමට පහලින් පාලමක් නොමැතිකමින් බොහෝ දුරක් ගොවින්ට පයින් ගමන් කිරිමට සිදු වීම එමෙන්ම ගිනි පෙට්ටි පාලමට ඉහලින් පාසල් ළමුන්ට ගමන් කිරිමේ පහසු ව ඇති පාලමක් ඉදි කර දෙන ලෙස කල ඉල්ලිම | ගිනි පෙට්ටි පාලමට පහළින් ඉල්ලා ඇති පාලම අනුමත වී ඇති අතර ඉදි කිරිම් කටයුතු ඉදිරි මාසයෙි දි සිදු වේවි. අනෙක් පාලම සම්බන්ධව ඉල්ලීමක් කරන්න. | වා: මා: දෙ: |
| කේ ගනේගෙදර මයා තිස්ස ගොවි සංවිධානයේ ගරු ලේකම් | මහවල යායට යන පාලම අලුත්වැඩියා නොකිරිම | වාරිමාර්ග ඉංජිනේරුතුමන් හමු වන ලෙස දැන්විය | වා මා දෙ |
| එල් පි ජයතිස්ස සේනානායක ගොවි සංවිධානයේ ගරුසභාපති | ආර් බි 6 බි ඇලේ වේල්ල පහතින් ඇති නිසා ජලය ගෙන යාමේ අපහසුතා ඇති බව | පුණරුත්තාපන වැඩසටහන යටතේ යමක් කල හැකිදැයි සොයා බලන බව පැවසිය | වා මා දෙ |
| ජ් පි සමින්ද මයා | කෘෂි පාර සකස් නොකිරිම | පෙබරවාරි මාසයේ ආරම්භ කරන බව | වා මා දෙ |

| | | | | |
|---|---|---|---|---|
| හෙළගම්පුර ගොවි සංවිධානයේ ගරු සභාපති | | පැවසිය | | |
| එම් පි මුනිදාස මයා මීගහපල්ලම ගොවි සංවිධානයේ ගරු සභාපති | මීගහ කුදුර ඇනිකට් එකේ ජල පාලනය සදහා කුමුක් ලෑලි නොමැතිකම හා ලෑලි ආරක්ෂිතව ලබා ගැනිමට කුටියක් ඉදිකර ගැනිම මීගහ කුදුර කිː මීː 1 1/2 ක් ගොඩදමා දෙන ලෙස කල ඉල්ලිම | ලෑලි සදහා ඉල්ලිමක් කර ඇත. ගොවින් ද නැවත ඉංජිනේරුතුමන්ට මතක් කිරිමක් කරන්න. ලෑලි තබා ගැනිමට ආරක්ෂක කුටිය ඉදි කිරිම සම්බන්ධව ඉල්ලික් කරන්න.<br>මැෂින් එකක් ලබා දෙන්නම් ඉන්දන ගොවි සංවිධානය සපයා ගන්න. | වා මා දෙ | |
| සුලෙයිමා ලෙබ්බේ මයා පෙරුවලිකණ්ඩම් ගොවි සංවිධානයේ ගරු සභාපති | පරක්කාඩි ඇනිකට් එකේ දොර කැඩි යාම තණකොළ රොඩු පිරි යාමෙන් ජලය ගලා යාම අවහිරවි තිබිම | ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර ලැබුනු විගස ගේට්ටුව සකස් කිරිම සිදු කරන බවත් අපද්‍රව්‍ය ඉවත් කිරිම මැෂින් එකක් යොදා සිදු කරන බවත් දැන්විය. | වා මා දෙ | |
| ඩබ් ආර් ජයතිලක මයා පැරකුම් ගොවි සංවිධානයේ ගරු ලේකම් | ආර් බි 6 ඇලේ වේල්ල පිරවිමේ අවශ්‍යතාවය | ටැක්ටර් 02 ක් ලබා දිමට එකග විය. | වා මා දෙ | |
| නේවාසික ව්‍යාපෘති කළමනාකරු එස් එල් ඒ අන්සාර් මහතා | ගල්මඩුව ගොවි සංවිධානයට අදාල නොවන ආර් බි 12 බෙදුම් ඇලේ කොටසක් ගොඩ දැම්මට ඔවුන් රුː75000 ක මුදලක් වැය කලා. මෙය නිත්‍යානුකූලව මුදල් නිදහස් කර ගැනිමක්ද නොවේ.<br>ඒ නිසා සිනි සමාගමට මෙහි වාසි වැඩිපුර ලැබෙන බැවින් ආයතනය මගින් මේ සදහා ගොවි සංවිධානයට සහනයක් සලසා දෙන ලෙස මා යෝජනා කරනවා. හේතුව මෙම කටයුත්තේ වැඩිපුර ප්‍රතිලාභ උක් ගොවින්ට නිසා. කෙසේ වෙතත් මෙම කන්නයේ දි උක් ඉඩම් බොහෝමයක වී වගාව සදහා අවස්ථාව ලැබුනු නිසා වැඩි ඉඩම් ප්‍රමාණයක වී වගාව සිදු කලා. ජලාශයේ ජල මට්ටම ඉතා පහල මට්ටමක තිබියදිත් එම වගාව සදහා ජලය සැපයිමට සිදු වුනා. මෙය ද කන්න රැස්වීම් තිරන වලට පටහැනිව යාමකි. ඉදිරි කන්නයේ දි අප කන්න රැසද්විමේ දි ගනු ලබන තිරණ පැහැදිලි ලෙස ක්‍රියාත්මක කල යුතු වෙනවා. | ආර් බි 12 බෙදුම් ඇල පසු ගිය කන්න වල සුද්ද කිරිම සිදු කලේ ගල්ඔය වැවිලි සමාගම මගිනුයි.<br>මෙම කන්නයේ ගොවි සංවිධානයෙන් සිදු කර තිබෙනවා කොටසක්. ඉතිරි කොටස සුද්ද කිරිම සමාගම මගින් සිදු කරනවා සුද්ද කර ඇති කොටස පිලිබදව ගෙවීම් කිරිමට මා හට තිරණය කල නොහැකි බැවින් අදාල බලධාරින් දැනුවත් කිරිමට එකග විය | ගල්ඔය වැවිලි සමාගම(වග ා කළමණාකරු ඉන්දික නාරායන මහතා | |

අද දින සාකච්ජාව සදහා වෙනත් කාරනා නොවුයෙන් නේවාසික ව්‍යාපෘති කළමණාකාර මහතා සියලු දෙනාට ස්තුතිය පිරිනමමින් රැස්විමේ කටයුතු පːවː 1 . 00 ට පමණ අවසන් කරන ලදි.

එස්. එල්. ඒ. අන්සාර්
නේවාසික ව්‍යාපෘති කළමනාකරු
දමන.

S.L.A. Ansaar
Resident Project Manager(Act.)
Gal-oya Right Bank
Damana.